# උසස් පෙළින් සරසවියට

## මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

### උසස් පෙළ ප්‍රතිඵල සංවර්ධන වැඩසටහන - 2025

### 12 ශ්‍රේණිය

### බෞද්ධ ශිෂ්ටාචාරය - II

කාලය : පැය 3යි.

සැලකිය යුතුයි.

- I කොටසේ ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න තුනක් ද තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු ලියන්න.

## I කොටස

01. (1) බ්‍රාහ්මණ සමාජයට අයත් ස්වධර්ම නම් කරන්න. (ලකුණු 02)

(2) ශ්‍රමණ සංස්කෘතිය තුළ දැකිය හැකි අනන්‍යතා ලක්ෂණ තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) ආශ්‍රම ධර්ම අතර පළමු අවධිය වන බ්‍රහ්මචාරී අවධිය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

(4) බුදුදහම තුළින් භාරතීය කාන්තාව භාර්යාවක ලෙස ලද නිදහස අගයන්න. (ලකුණු 05)

(5) අජිත කේශකම්බලී ශාස්තෘවරයාගේ දර්ශනය කෙබඳු දැයි විස්තර කරන්න. (ලකුණු 06)

02. (1) බුද්ධ කාලීන භාරතය තුළ ප්‍රකට ව පැවැති සමූහාණ්ඩු දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) බුදුරදුන් අනුදැන වදාළ බෞද්ධ ධනෝපායන ක්‍රම තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(3) කොසොල් ජනපදය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්න. (ලකුණු 04)

(4) බිම්බිසාර හා අජාසත් යන රජවරු බුදුරජාණන් වහන්සේ සමඟ පැවැති සබඳතා කෙබඳු දැයි විස්තර කරන්න. (ලකුණු 05)

(5) ක්‍රි.පූ. 6 වන සියවස පමණ වන විට භාරතයේ වෙළෙඳාම හා වෙනත් කර්මාන්ත දියුණුව පැවතුන බවට උදාහරණ සපයන්න. (ලකුණු 06)

03. (1) බුදුරජාණන් වහන්සේ තුළ පැවැති "සුගත" බුදු ගුණය හඳුන්වන්න. (ලකුණු 02)

(2) බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණයට පාත්‍ර වූවන් තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

(3) බුදුරජාණන් වහන්සේගේ පද්මාකාර දිවිය කෙටියෙන් පහදන්න. (ලකුණු 04)

(4) සැරියුත් මහ රහතන් වහන්සේගේ චරිතය පිළිබඳ විග්‍රහයක යෙදෙන්න. (ලකුණු 05)

(5) බුදුරජාණන් වහන්සේ තුළ තිබූ මහා ප්‍රඥා ගුණය කෙබඳුදැයි පැහැදිලි කරන්න. (ලකුණු 06)

## *II කොටස*

04. (1) උපත පදනම් කරගෙන මනුෂ්‍ය වර්ගයා උසස් - පහත් ලෙස වර්ගීකරණය කළ නොහැකි බව බෞද්ධ මූලාශ්‍ර සාධක ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(2) පුද්ගල ස්වාමීත්වය, ස්වාධීනත්වය හා ස්වච්ඡදතාව පිළිබඳ බුදු සමයේ ආකල්පය වෙනත් සමකාලීන ආගමික ඉගැන්වීම්වලින් වෙනස් වන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 10)

05. (1) හොඳ නරක ක්‍රියා තමා විසින් ම තීරණය කර ගත යුතු ආකාරය පිළිබඳ බුදු දහම ලබා දී ඇති උපදෙස් පැහැදිලි කරන්න. (ලකුණු 10)

(2) නූතන සමාජය තුළ ඇති ප්‍රධාන සමාජ ගැටලු අවම කර ගැනීමට පංචශීල ප්‍රතිපදාව මඟින් ලැබෙන පිටිවහල පැහැදිලි කරන්න. (ලකුණු 10)

06. (1) නූතනයේ ඇති වී ඇති පාරිසරික ගැටලු අවම කර ගැනීමට, පරිසරය සංරක්ෂණය පිළිබඳ බුදුරදුන් ලබාදුන් උපදෙස් උපයෝගී කර ගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 10)

(2) සෞන්දර්ය රසාස්වාදය පුද්ගලයාගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා ඉවහල් කර ගත හැකි ආකාරය බුදු දහමට අනුව විමසන්න. (ලකුණු 10)

07. (1) ධන විසර්ජනය හෙවත් ධන පරිහරණය කළ යුතු ආකාරය පිළිබඳ බුදු දහමින් ලබා දී ලබා දී ඇති උපදෙස් ඇගයීමකට ලක් කරන්න. (ලකුණු 10)

(2) ධාර්මිකව උපයාගත් ධනය තුළින් ලබා ගත හැකි සැපයන් පිළිබඳ අණන සූත්‍රය ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 10)

08. (1) සාර්ථක රාජ්‍ය පාලනයකින් උදෙසා දස රාජ ධර්ම අනුගමනය කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න. (ලකුණු 10)

(2) භෞතික සම්පත් කළමනාකරණය කර ගත යුතු ආකාරය පිළිබඳ බුදුදහම ලබා දී ඇති උපදෙස් ඇගයීමට ලක්කරන්න. (ලකුණු 10)

* * * * *